# 4 සැඟවුණු නිධානය



"අයියේ, අයියේ අන්න සුදු සීයා එනවා." උදාරි සතුටින් කෑ ගැසුවා. චතුරත් උදාරිත් ගිහින් සීයාගෙ අතින් අල්ලාගෙන ආවා.

"අදත් අපට හොඳ කතාවක් අහන්න පුළුවන්". උදාරි කිව්වා. "සීයේ එන්න, එන්න, ඉඳගන්න." "සීයා හොඳ කතන්දර දන්න කෙනෙක්. ඒ හින්ද අපි ආසයි සීයාගෙන් කතන්දර අහගන්න." චතුර සීයා ළඟට කිට්ටු වුණා.

"හොඳයි, අද මම පුතාලාට හොඳ කතාවක් කියා දෙන්නම්."

"අම්මේ සීයාට කෝපි කෝප්පයක් හදලා දෙන්න." උදාරි සතුටින් කිව්වා. සීයා කතාව පටන් ගත්තා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



"ඔන්න දරුවනේ! පුරාණ භාරතයේ ධනයෙන් ආඪ්‍ය රජ කෙනෙක් හිටියා."

"ඒ කියන්නේ සීයේ, පොහොසත් රජ කෙනෙක් හිටියා කියන එක නේ ද?"

"ඔව්, ඔව්, මගේ පුතාට ඔය හොඳට තේරෙන්නෙ. ඒ රජ්ජුරුවන්ට පුත් කුමරෙක් හිටියා. එයා තරුණ වයසට ආවට පස්සෙ උගත්, ශ්‍රේෂ්ඨ ගුරුතුමකු ළඟට ශිල්ප හදාරන්න යැව්වා."

"ඒ කාලෙ කුමාරවරුන් ඉගෙන ගත්තේ ගුරු ගෙදර නැවතිලා. ගුරුතුමා හැමදාම හවසට ගෝල පිරිසත් එක්ක නාන්න ගඟට යනවා. "

"ගඟට යන පාර අයිනේ තල පැදුරක් වනලා තිබුණා. මේ කුමාරයා මේක දැක්කා. එයාට ආසා හිතුණා

තල ටිකක් කන්න. ඊට පස්සේ තල අහුරු කිහිපයක් හොරෙන් අරගෙන කෑවා.”

“මේ තල පැදුරු අයිති ආච්චි මේක දැක්කා. කිහිප දවසක් මේ විධියට සිදු වුණා. ඒත් ඒ ආච්චි ඉවසුවා.”

“ඒ ආච්චි හරි හොඳයි නේ ද සීයෙ?” උදාරි ඇහුවා.

“ඔව්, දුවේ. ඒත් දවසක් ආච්චි මේ හොරකම ගුරුතුමාට කිව්වා. ගුරුතුමාට ඒ ගැන කේන්ති ගියා.”



“කුමාරවරුන් බොහෝ දෙනකු ඒ කුමාරයා දිහා පිළිකුලෙන් බැලුවා.”

“ගුරුතුමා කුමාරයාට දඬුවම් කරන්න ඇති නේ ද සීයෙ?” චතුර ඇහුවා.

"ඔව්, ළඟ තිබුණ පඳුරකින් කෝටුවක් කඩාගෙන පාරවල් දෙකක් ගැහුවා."

ඔක්කොම කුමාරවරු ඒ දිහා බලා හිටියා.

"ආයෙ එහෙම අනුන්ගෙ දේවල් හොරෙන් ගන්න එපා, ඒක නරක දෙයක්." කියලා ගුරුතුමා අවවාද කළා.

කුමාරයාට ගුරුතුමා ගැන තරහක් ඇති වුණා.

"ඊට පස්සේ මොක ද වුණේ සීයේ?" උදාරි ඇහුවා.

ඒ කුමාරයා ඉගෙනගෙන අවසන් වුණා. තමන්ගෙ රටට ගියා, රජකම භාර ගත්තා.

"සීයේ, කුමාරයා හොඳට රජකම් කරන්න ඇති නේ ද?" උදාරි ඇහුවා.

ඔව්, ඒත් ගුරුවරයා ගැන මේ රජතුමාගේ හිතේ තරහ තිබුණා. ගුරුතුමා ගෙන්නලා දඬුවම් කරන්න තීරණය කළා.

"රජ්ජුරුවෝ ගුරුතුමාට දඬුවම් කළා ද සීයෙ ?" චතුර ඇහුවා.

"නෑ. රජතුමාට ඒකට ඉඩක් ලැබුණෙ නැහැ. "

"ගුරුතුමා එදා දඬුවම් කරපු හේතුව පැහැදිලි කළා."

"එදා මම ඔබට දඬුවම් කළේ නැතිනම් ඔබ ලොකු හොරෙක් බවට පත් වෙනවා. එතකොට ඔබට රජකම ලබා ගන්න බැරි වෙනවා. ජීවිතෙත් අහිමි වෙන්න ඉඩ තිබුණා. මම එදා දඬුවම් කළ නිසයි ඔබ හොඳ කෙනෙක් වුණේ."

ඇමති මණ්ඩලයත් ඒක අනුමත කළා.

රජ්ජුරුවන්ට ලැජ්ජා හිතුණා.

ගුරුතුමාට ආරාධනා කළා රජකම භාර ගන්න.



"ඒත් ගුරුතුමා ඒ ඉල්ලීම භාර ගත්තෙ නෑ."

"ඔහු රජතුමාට දීර්ඝායුෂ පැතුවා. ආශිර්වාද කළා."

ගුරුතුමා ආපසු ගුරුගෙදරට යන්න ගියා.

රාජසභාවේ සේරම සතුටු වුණා.

"සීයේ, ඔය කතාව තියෙන්නෙ මොන පොතේ ද?" චතුර ඇහුවා.

"ඔය කතාව තියෙන්නේ පන්සිය පනස් ජාතක කතා පොතේ. කතාවේ නම තිලමුට්ඨි ජාතකය."

"පුතාලා මේ වගේ කතා හොයාගෙන කියවන්න ඕනෑ."

"හොඳයි සීයේ." උදාරිත් චතුරත් සීයාට පොරොන්දු වුණා.

## පද අරුත් දැන ගන්න.

| | | |
|---|---|---|
| ධනය | - | වස්තුව |
| ආඪ්‍ය | - | පිරුණු |
| භාරතය | - | ඉන්දියාව |
| දීර්ඝායුෂ | - | දිගුකල් ජීවත් වීම |
| ආශිර්වාද | - | සුබ පැතුම් |

## ක්‍රියාකාරකම 1

(i) චතුර ඔබ යැයි සිතා සුදු සීයා කියා දුන් කතාව පන්තිය ඉදිරියේ කියන්න.

(ii) කතාවේ සිදුවීම් ගළපා, නිවැරදි ව වාක්‍ය ගොඩනගා, කතන්දරයක් ලෙස ලියන්න.

## ක්‍රියාකාරකම 2

පහත දැක්වෙන ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා කියන්න. පසුව පොතේ පිටපත් කරන්න.

(i) සීයාට වාඩි වීමට කීවේ කවුද?

**(අම්මා / චතුර / උදාරි)**

(ii) පැරණි භාරතයේ කුමාරවරුන් ඉගෙනුම ලැබුවේ කොහේ ද?

**(පාසලේ / ගුරුගෙදර / රජගෙදර)**

(iii) නාන්නට යද්දී කුමරා සොරකම් කළේ මොනවා ද?

**(රෙදි / පැදුරු / තල)**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iv) කුමාරයා තම රටට ගොස් භාරගත්තේ කුමක් ද?

**(දඬුවම / රජකම / ගුරුකම )**

(v) මෙම පාඩමේ සඳහන් සුදුසු නැති කටයුත්ත කුමක් ද?

**(අනුන්ට යමක් දීම/ අනුන්ගේ දේ ආරක්ෂා කර ගැනීම / අනුන් සතු දේ ගැනීම)**

## ක්‍රියාකාරකම 3

පහත දක්වෙන රූප දෙස බලා කතාවක් ගොඩ නගන්න. එය පන්තියට කියන්න.

1



2



3



4



## ක්‍රියාකාරකම 4

(i) පහත දක්වා ඇති වචන ගුරුතුමාගේ සහාය ඇති ව හඳුනා ගන්න.

(ii) ඒ වචනවල ඉරි ඇඳ ඇති අකුරු පිළිබඳ අවධානය යොමු කරමින් ශබ්ද නගා කියවන්න.

| | |
|---|---|
| ඛනිජ | ආඪ්‍ය |
| සජ්ඣායනා | දීර්ඝායුෂ |

**හඬ බරකොට කියන මේ අකුරු මහාප්‍රාණ නම් වේ.**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 5

(1) එක එක මහාප්‍රාණ අකුර හා ඊට ගැළපෙන අල්පප්‍රාණ අකුර රවුම් කර දක්වා ඇත. ඒවා සසඳා බලන්න. ශබ්ද නගා කියවන්න. ඒවායේ වෙනස හඳුනාගන්න.

වාක්‍ය
ශාඛාව

කුඩය
ආඪ්‍ය

සජ්ඣායනය
ජාතකය

වර්ගය
දීර්ඝය

(2) මහාප්‍රාණ අකුරු සහිත ව යෙදෙන වෙනත් වචන ද හඳුනා ගන්න.

| | | |
|---|---|---|
| භාරතය | ධනය | ශ්‍රේෂ්ඨ |
| ලේඛන | ඡන්දය | සඵල |

## ක්‍රියාකාරකම 6

පහත සඳහන් වචන අල්පප්‍රාණ මහාප්‍රාණ වශයෙන් වෙන් කර ඒ සඳහා තබා ඇති, කළ දෙකට දමන්න. එම වචන, යොදා කෙටි වැකි ලියන්න.

| | |
|---|---|
| ඡේද | කන |
| රුඪී | ඡායාව |
| බසය | වර්ධනය |
| ඝෝෂාව | ආරුඪ |
| දර | මර්දනය |









නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 7

පහත සඳහන් වචන පිළිවෙළට ගළපා වැකි සකස් කර කියවන්න. අභ්‍යාස පොතේ ලියන්න.

උදාහරණය:- සෙල්ලම්/වතුර/ගියා/කරන්න
වතුර සෙල්ලම් කරන්න ගියා.

(i) සීයෙ/ඒ ආච්චි/හොඳයි/නේ ද/හරි

(ii) ගිහින්/කුමාරයා/ භාරගත්තා/රජකම/තම රටට

(iii) මොන/ සීයෙ/ ඔය කතාව/තියෙන්නෙ/පොතේ ද

(iv) පැතුවා/ගුරුතුමා/රජතුමාට/දීර්ඝායුෂ

(v) ඒ කාරණය/කළා/ඇමති/මණ්ඩලය/අනුමත

## ක්‍රියාකාරකම 8

(1) පහත සඳහන් එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා ලියන්න.

(i) ඊට පස්සෙ ______________________ වුණේ සීයෙ?

(ii) ගුරුතුමාට දඬුවම් ______________________ සීයෙ?

(iii) බලන්න අර එන්නෙ ______________________ කියලා?

(iv) ඔයා ළඟ පෑනක් ______________________?

(v) ඒ කතාව පුතාට හොඳට ______________________?

(කවුද, මතක ද, මොකද, කළා ද, තියෙනව ද)

## ක්‍රියාකාරකම 9

(i) පහත දක්වෙන වැකි කියවන්න. තද කළු අකුරින් මුද්‍රිත වචන දෙස බලන්න. කියවන්න. ඒවා හඳුනාගන්න.

- සීයා කතන්දර දන්න **කෙනෙක්.**
- සීයාට කෝපි කෝප්පයක් හදන **කෙනා** කවුද ?
- තල අහුරු **කිහිපයක්** අරගෙන කෑවා.
- බොහෝ **දෙනෙක්** අසතුටෙන් බැලුවා.
- **ඔක්කොම** ඒ දිහා බලා හිටියා.
- රාජසභාවේ **සේරම** සතුටු වුණා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(ii) වම්පස කොටුවේ ඇති එක් එක් හිස්තැනට යෙදිය හැකි සුදුසු පදය දකුණු පස කොටුවෙන් තෝරා ලියන්න.

කියවන්න.

| | | | |
|---|---|---|---|
| i | එයා දොස්තර________ | i | දෙනෙක් |
| ii | ඒ__________අපේ අය. | ii | කිහිපයක් |
| iii | ඔයා තමා හරි ම______ | iii | ඔක්කොම |
| iv | වැඩි_______පිරිමි ළමයි. | iv | සමහරු |
| v | ______හිටියොත් හොඳා. | v | සේරම |
| vi | මම ___________ කෑවා. | vi | කෙනෙක් |
| vii | ___________ උසයි. | vii | කෙනා |
| viii | බස්________ගියා. | viii | ටිකක් |

## ක්‍රියාකාරකම 10

පහත දක්වෙන අකුරු සටහනෙහි කළු අකුරෙන් මුද්‍රිත අකුරේ සිට හරහට හෝ පහළට හෝ යනවිට මහාප්‍රාණ අකුරක් සහිත වචනයක් සාදාගත හැකි ය. එම වචන සොයා කාඩ්පත්වල ලියන්න. ශබ්ද නගා කියවන්න.

පසු පිටෙහි දැක්වෙන රූපය ඔබේ අභ්‍යාස පොතෙහි පිටපත් කරගෙන එම කාඩ්පත් අලවන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඡ | ත් | ද | ය | ඣ | හ | ස |
| ශු | ඪ | ගා | ඵා | ච | ඝ | ං |
| ක | ඨෝ | ර | ඊ | සු | ත | ඛ |
| ඵ | ස | තා | ඵ | ශී | අ | ඍා |
| බු | ද් | ධි | ය | ශු | දු | ච |
| අ | ධි | ෂ් | ඨා | ත | ර | ශු |
| භූ | ම | ද | න | ඛ | ති | ජ |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.


ව
ච
න
ග
ස